තනි තරුවක් යට සඳකඩ පහණක් අභියස ගීතමය භාව අත්දැකීමක් සමගින් කාල පැය තුනක හෝරාවක් රසයට සමවදින්න කෙරෙන ආරාධනයයි රසෝඃා

ආදරයේ උල්පත වූ අම්මා
මා ඔබගේ පුතුවූ
ඔබ මතු බුදුවන භවයේ
මා රාහුල කුමරුන්සේ
සෙවණ පතා අදමෙන් පැමිණෙන්නෙමි
සුලැගිල්ලේ එල්ලී

නිර්මාණය කර ඇති ගී තනු ගණනින් දහස් ගණනකි.

සිංහල සංගීතයේ සිංහල ස්වරය ලෙස හඳුන්වන සුනිල් එදිරිසිංහයන් තම සහෝදරයා වූ සතිස්චන්ද්‍ර එදිරිසිංහයන් විසින් නිෂ්පාදනයකළ, වික්ටර් රත්නායකයන් සංගීතය අධ්‍යක්ෂණය කළ මාතර ආච්චි චිත්‍රපටයේ සඳකඩ පහණක කැටයම් ඔපලා ගීතයෙන් ස්වකීය සංගීත චාරිකාව අරබනුයේ වර්ෂ 1973දීය. පසුව වික්ටර් රත්නායකයන්ගේ ස

වසර හතලිස් හතරක සංගීත දිවිය තුල එදාමෙන්ම අදත් තම හඬ පෞර්ශයෙන් රසික සිත් සුවපත් කරන සුනිල් එදිරිසිංහයන් ප්‍රසංගය පිලිබඳව දරන්නේ මෙවැනි අදහසකි

## චානක ඉලංගගේ 365 දින

ගීතයේ අපේ ලකුණ ඒ මහා ගාන්ධර්වයායි. ඉන්දීය මහා සංගීත අභාෂයෙන් මිදුන සිංහල සරල ගීතය ප්‍රචලිත වෙන්නේ එතුමාගේ සංගීත නිර්මාණයන් ඔස්සේයි. මෙල්බර්න් ප්‍රසංගයෙදී මම මගේ ජනප්‍රිය මගේ රසිකයින් ආදරය කරන ගීත ගොන්නක්ම ගායනය කිරීමට බලාපොරොත්තු වෙනවා. ලංකාව තුළ අද වෙන විට සුභාවිත ගීතයට යම් අයහපත් තත්වයක් ඇතිවී තිබෙන කාලවකවාණුවක මෙල්බර්න්හි සිංහල ගීත රසික රසිකාවියන් සුභාවිත ගීතයේ වටිනාකම හඳුනාගෙන කරන මෙම ප්‍රසංගය සුභාවිත ගීතයේ උන්නතිය උදෙසා කරන කාර්‍යක් හැටියටයි මම දකින්නේ.

රට තුළ සිංහල සංගීතයේ ඉදිරි පැවැත්ම උදෙසා මහා අරගලයක යෙදී සිටින මොහොතක නිරෝෂන් මහතා ප්‍රමුක සංවිධායකයින් රැල්ලෙන් මිදී මනසට ගෝචර වන ගීතයක රසය විඳීමට ඉඩ හරසර ලබාදීම මෙල්බර්න් සිංහල ගීත ලෝලීන්ගේත් භාග්‍යක් ලෙසයි මට හැගෙන්නේ .මෙල්බර්න් වේදිකාව මට අලූත් තැනක් නොවෙයි. නමුත් වික්ටර් රත්නායකනුත් මමත් එක්ව මෙල්බර්න්වල කරන පළමු ප්‍රසංගය මෙයයි. මේ වනවිට මෙම ප්‍රසංගය එක්සත් රාජධාණිය ඇතුලූව රටවල් විස්සක පමණ ඉතාම සාර්ථකව වෙදිකාගතකරන්නට මටත් වික්ටර් රත්නායකයන්ටත් හැකියාව ලැබී තිබෙනවා. එවැනි සාර්ථක ප්‍රසංගයක සජීව අත්දැකීමක් විඳගැනීමට ධප්එදඉැර මස 7 වන දින Burwood Basen ශාලාව වෙත පැමිණෙන මෙන් මම මගේ මෙල්බර්න් රසික රසිකාවියන්ගෙන් ඉතාම ආදරයෙන් ඉල්ලා සිටිනවා.

# "ස" ස්වරය සමග ගැයෙන "සුනිල" ස්වරය රසෝඃා



සඳකඩ පහණක කැටයම් ඔපලා
පාවෙන දේදුණු ලැගුම් ගනී
කැලතුණු රසයක පැන ආ බුබුලක්
අකුරු වැලක් දෙහදක ලියවී

රසයේ නව මාණයන් සොයායන DES එන්ටර්ටෙන්මෙන්ට් විසින් මෙල්බන්හී වෙසෙන සිංහල සංගීත ලෝලීන්ගේ රසාස්වාදය උදෙසා පිදෙන නවමු ගීත අත්දැකීම රසෝඃා සංගීතමය අත්දැකීම October මස 7වන දින Burwood Basen centre හීදී වේදිකා ගත වන්නේ යුගයේ අග්‍රගණ්‍ය ගායකයන් දෙපලක් වන ආචාර්ය වික්ටර් රත්නායකයන් සහ සුනිල් එදිරිසිංහයන් සමගිනි. ප්‍රවීණ සංගීතඥ සුරේෂ් මාලියද්ද සහ පිරිසගේ නාද රටා මැද ප්‍රසංගය ගීතවත් වන්නේ එදින සවස 6.30ය

වසර 2000දී ප්‍රථම වරට වේදිකා ගතවන වික්ටර් සුනිල් ගීත ප්‍රසංගය අද වන විට දෙස් විදෙස් රටවල් විස්සකට ආසන්න සංඛ්‍යාවක වසර දාහතක කාලයක් පුරා වාර පණහකට වඩා වැඩි වාරගණනක් විවිද නම් වලින් වේදිකා ගතව අවුත් October මස 17 වන දින රසෝඃා නමින් මෙල්බන්හීදී වේදිකා ගතවන්නේ ප්‍රථම වරටය.

සිංහල ගීත වංශ කතාවේ වික්ටර් රත්නායකයන්ට සහ සුනිල් එදිරිසිංහයන්ට හිමිවන්නේ සුවිශේෂ තැනකි. මාතර ආච්චි චිත්‍ර පටයෙන් ඇරඹෙන වික්ටර් සුනිල් සුසංයෝගය සිංහල සුභාවිත ගීතය නව මාණයකට රැගෙන ගිය බව නොරහසකි. ස ප්‍රසංග එක්දහස් පන්සියයකට ආසන්න වාර ගණනක් පවත්වමින් සුභාවිත ගීතයේ නිම් වළලූ ප්‍රසාරණය කල වික්ටර් රත්නායකයන් සංගීතයේ නවමාණයන් සොයා යමින් ගීතයේ උන්නතිය උදෙසා කල මෙහෙය අපරිමිතය. තමා සතු ගීත ගොන්නට අමතරව සහෝදර ගායක ගායිකාවන් උදෙසා රත්නායකයන්

ප්‍රසංගයේ අත්වැල් ගායනය හා එක්වන එදිරිසිංහයන් එදාමෙදා තුර සුභාවිත ගීතයේ පැවැත්ම උදෙසා ගායනය කර ඇති ගීත ප්‍රමාණය ගණනින් ආසන්න වශයෙන් ගීත හයසියයක් පමණ වෙයි.

සිංහල සංගීතයේ බිහිවූ ඒ මහා ප්‍රතිභාසම්පන්න සංගීත වේදීන් අතලොස්සෙන් කෙනෙක් හැටියටයි මම වික්ටර් රත්නායකයන් දකින්නේ. සරල

## විනී

